රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/93 (VI)

මගේ අංකය : EST-7/COMPT/02/2003-I
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2017.10.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධරයන්ට වන්දි ගෙවීම</u>**

ඉහත කරුණට අදාළව 1993.09.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 හා එයට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93ට සංශෝධනයක් ලෙස නිකුත් කරන ලද 2005.05.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93(III)හි සඳහන් පහත දක්වා ඇති රාජකාරී අවස්ථාවන් හීදී පමණක් සිදුවන අනතුරු හේතුවෙන් රජයේ නිලධරයකු මරණයට පත්වූ විට, එම නිලධරයා මියයන අවස්ථාවේ දී දැරූ ශ්‍රේණියේ සිට ඊළඟ ඉහළ ශ්‍රේණියට මියගිය දිනයේ සිට උසස් කළයුතු බවට 2017.07.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

i. ස්වකීය රාජකාරී ඉටු කිරීමේ දී
ii. රාජකාරී ඉටු නොකරන අවස්ථාවකදී වුවද ස්වකීය සාමාන්‍ය රාජකාරීවල විෂය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේ දී
iii. ස්වකීය රාජකාරී කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්
iv. සේවා ස්ථානයේ සිට රාජකාරී කටයුතුවල නිරතවීම සඳහා යන ගමනක දී හෝ සේවා ස්ථානයට ආපසු එන ගමනක දී

03. මෙම උසස්වීම් ශ්‍රේණිගත උසස්වීම් සඳහා පමණක් අදාළ කරගත යුතුය.

04. මෙම චක්‍රලේඛ විධිවිධාන 2017.07.18 දින සිට ක්‍රියාත්මක වේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය